සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# විශාඛා විද්‍යාලය කොළඹ - 05
# Visakha Vidyalaya, Colombo - 05

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

093

| | | |
|---|---|---|
| ඉතිහාසය I<br>History I | 11 ශ්‍රේණිය<br>Grade 11 | කාලය පැය එකයි.<br>*Time -One hour* |

නම / අංකය : ........................................................................................

සැලකිය යුතුය.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.
- මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.

1) මහා වංශයේ ඇතැම් කොටස් අර්ථ විවරණය කර ගැනීම සඳහා රචනා කර ඇති ග්‍රන්ථය කුමක් ද?

(i) පූජාවලිය (ii) වංසත්ථප්පකාසිනිය
(iii) සාරාර්ථ සංග්‍රහය (iv) සාර සංග්‍රහය

2) පැරණිතම සෙල්ලිපිවල ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ කුමන තොරතුරු ද?

(i) භික්ෂූන්ට ලෙන් පිදීම ය. (ii) දේශපාලන තොරතුරුය.
(iii) ආගමික තොරතුරු ය. (iv) වෙළඳ කටයුතුය.

3) අතීතයේ ගොඩවාය වරායෙන් ජේගු බදු අයකළ රජු ලෙස සැලකෙන්නේ,

(i) ජයබාහු රජුය (ii) I වන විජයබාහු රජුය.
(iii) I වන ගජබාහු රජු (iv) වීරබාහු රජුය.

4) අතීතයේ විවිධ දිමනා පිළිබඳව තොරතුරු සඳහන් වටාපතක සළකුණින් අදහස් වන්නේ,

(i) පවිත්‍රත්වය (ii) රාජකීයත්වය
(iii) ලෞකිකත්වය (iv) සදාකාලික බව

5) පැරණි කාලයේ ශිල්ප ශ්‍රේණි අනුව බිහි වූ "කේවට්ටගාම" කුමන ශිල්පයකට අදාළ ග්‍රාමයක් ද?

(i) වෙළඳාම් කටයුතු (ii) ගොවිතැන් කටයුතු
(iii) ධීවර කටයුතු (iv) වඩුවැඩ කටයුතු

6) අතීතයේදී "උසබ" යන මිනුම් ක්‍රමය භාවිත කරන ලද්දේ,

(i) දුර මැනීමට ය. (ii) කාලය මැනීමට ය.
(iii) අවකාශය මැනීමට ය. (iv) බර මැනීමටය.

7) "ලපන තිස්ස" නම් චිත්‍ර ශිල්පියෙකු ගැන තොරතුරු සඳහන් සෙල්ලිපිය වන්නේ,

(i) නැවිටුකන්ද සෙල්ලිපිය (ii) මැදගම සෙල්ලිපිය
(iii) කොතලකිඹියාව සෙල්ලිපිය (iv) හැලඹගල සෙල්ලිපිය

8) අතීත සමාජය තුළ කාන්තාව ගෞරවාදරයට පාත්‍ර වූයේ,

(i) කුල ගෞරවය රැකෙන පරිදි ජීවත් වූ නිසාය.
(ii) බුදු දහමට ලැදිව කටයුතු කළ නිසාය.
(iii) රාජ්‍ය පාලන කටයුතුවලට සම්බන්ධ වූ නිසාය.
(iv) මව්වරුන් ලෙස වගකීම් ඉටු කළ නිසාය.

9) බුදු දහම ලැබුණු මුල් කාලයේ සිටම මෙරට කඨින පිංකම් පැවති බවට තොරතුරු ලබා ගත හැකි සෙල්ලිපිය වනුයේ,

(i) අම්පාර සෙල්ලිපිය (ii) බ්‍රාහ්මණයාගම සෙල්ලිපිය

(iii) හැලඹගල සෙල්ලිපිය (iv) සිතුල්පව්ව සෙල්ලිපිය

10) අතීත ශ්‍රී ලංකාවේ වැසියන් කිරිමඩු ශාන්ති කර්ම සිදුකළ බවට තොරතුරු හමුවන ප්‍රදේශයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) ගල්පාය (ii) හම්බන්තොට

(iii) කන්තලේ (iv) මැදිරිගිරිය

11) අතීත වාරි තාක්ෂණයේ විශිෂ්ටත්වය විදහාපාන නිර්මාණයක් ලෙස සලකනුයේ,

(i) මිණිපේ ඇල තැනීමයි. (ii) ඇලහැර ඇල තැනීමයි

(iii) අංගමැඩිල්ල ඇල තැනීමයි (iv) යෝධ ඇල තැනීමයි.

12) වැවක ප්‍රධානම අංගය වැව් බැම්මයි. වැව් බැම්ම හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(i) වැව් බැම්මක උස වැඩි වන විට බැම්ම දිගින් වැඩි කළ යුතුයි.

(ii) වැව් බැම්ම ගිලා බැසීම වැළැක්වීමට අත්තිවාරමක් යෙදිය යුතුයි.

(iii) වැව් බැම්ම ශක්තිමත් වීමට බැම්මේ දෙකෙළවර කඳුවැටි තුළට යා කළ යුතුය.

(iv) වැව් බැම්ම මුදුනට වඩා පහළ කොටස පළලින් වැඩි වන ලෙස සැකසීම කළ යුතුය.

13) යාපන රාජ්‍ය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශ මින් කුමක් ද?

(i) විජය කුලංගෙ යාපන රාජධානියේ ආරම්භක පාලකයා වේ.

(ii) පෘතුගීසි විරෝධී පාලකයෙකු වූ විදියේ බණ්ඩාර ආරක්ෂාව පතා යාපනයට පලා ගියේ ය.

(iii) යාල්පාන වෛපවමාලෙ ග්‍රන්ථයේ යාපන රාජ්‍ය ගැන තොරතුරු සඳහන් ය.

(iv) යාපනයේ වානිජ බෝත වගාව හේතුවෙන් පෘතුගීසි ඒ වෙත අවධානය යොමු කළේය.

14) ආක්‍රමණිකයෙකු උවද සාධාරණ හා නීති ගරුක පාලනයක් ගෙන ගිය බව මහාවංශ කතුවරයා කරුණු දක්වන අනුරපුර රාජ්‍ය පාලකයා කවරෙක් ද?

(i) රාජේන්ද්‍ර චෝල (ii) සේන ගුත්තික

(iii) එළාර (iv) ශ්‍රී මාර ශ්‍රී වල්ලභය

15) ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහතින් දක්වා ඇත. එම සිදුවීම් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

A - අරාබි ජාතික ඉබන්බතුතා මෙරටට පැමිණීම

B - චන්ද්‍රභානු ලංකාව ආක්‍රමණය කිරීම

C - උඩරට ජෝතිය සිටුවරයා විසින් කැරැල්ලක් ඇති කිරීම

D - ගද්‍ය සාහිත්‍ය මැනවින් පෝෂණය වීම.

(i) DBAC (ii) DABC (iii) BDAC (iv) BCDA

16) මහනුවර රාජ්‍ය සමයේ "පරවේනි ගම්" නමින් හඳුන්වනු ලැබුයේ,

(i) විහාරාරාම සඳහා පූජා කළ ඉඩම්ය.

(ii) රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන් කළ ඉඩම්ය.

(iii) රදළ ප්‍රධානීන්ගේ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම්ය.

(iv) ගම්වැසියන් පරම්පරාගතව භුක්ති විඳි ඉඩම්ය.

17) පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් අනුරාධපුර යුගය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය සඳහන් කරන්න.

(i) බුදු දහමත් සංස්කෘතියත් ඉතා දියුණු තත්වයක තිබීම.

(ii) අවුරුදු 1400 ට වැඩි කලක් මෙරට අගනගරව තිබීම

(iii) මහාතිත්ථ මෙම යුගයේ ප්‍රධාන වෙළඳ වරාය වීම

(iv) IV මිහිඳු රජුගේ දුර්වල පාලනය මෙය බිඳවැටීමට හේතු වීම .

18) I වන විජයබාහු රජු අවසන් වරට සොළීන් පරාජය කිරීම සඳහා සේනා සංවිධානය කළ ස්ථානය කුමක් ද?

(i) ගොඩවාය (ii) කාචරගාම (iii) මහානාගහුල (iv) කසාතොට

19) තම දේශපාලන ප්‍රතිවාදීන් අභිබවා වැසියන් අතර ජනප්‍රිය වීම සඳහා ප්‍රචාරක මාධ්‍යයක් ලෙස ශිලාලිපි විශාල වශයෙන් කරවන ලද පාලකයා මින් කවරෙක් ද?

(i) නිශ්ශංකමල්ල රජුය.

(ii) IV උදය රජුය.

(iii) මිහිඳු රජුය.

(iv) පරාක්‍රමබාහු රජුය.

20) I වන විජයබාහු රජු ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස සැලකීමට ප්‍රධානම හේතුව කුමක් ද?

(i) පොළොන්නරුව අගනගරය කර ගැනීම

(ii) ඉන්දීය කුලී හමුදා සහය ගෙන දළදා මාලිගාව ආරක්ෂා කිරීම

(iii) ඉන්දියාව සමඟ විවාහ සබඳතා ගොඩ ගැනීම.

(iv) සොළී පාලනයෙන් රට මුදවා ගෙන බලය මධ්‍යගත කිරීම.

21) ක්‍රි.ව. 1215 කාලිංග මාඝගේ දරදඬු පාලනය හමුවේ බිඳ වැටුණු පොළොන්නරු රාජධානියේ අවසන් පාලකයා වූයේ,

(i) කල්‍යාණවතී රැජිණය.

(ii) පරාක්‍රම පාණ්ඩ්‍ය රජුය.

(iii) ලීලාවතී රැජිණය.

(iv) ගජබාහු රජුය.

22) ලංකාවට පෘතුගීසීන් පැමිණෙන විට කන්ද උඩරට පාලනය කළ රජු කවරෙක් ද?

(i) සේනා සම්මත වික්‍රමබාහු රජුය.

(ii) ජයවීර බණ්ඩාර රජුය.

(iii) II විමලධර්මසූරිය රජුය

(iv) කරලියැද්ද බණ්ඩාර රජුය

23) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් උඩරට හා පෘතුගීසීන් අතර වූ සම්බන්ධතා පිළිබඳව සත්‍ය ප්‍රකාශ ඇතුළත් පිළිතුර වූයේ,

A - පෘතුගීසීන් උඩරට රජුන් සමඟ ලන්දේසීන්ට වඩා මිත්‍රශීලීව කටයුතු කළේය.

B - උඩරට ප්‍රදේශවල පාලන බලයක් ලබා ගැනීමට අපොහොසත් වීම

C - උඩරට සමඟ පෘතුගීසි සබඳතා ආක්‍රමණශීලී එකක් වීම

D - පෘතුගීසීන් උඩරට ප්‍රදේශවල වෙළඳ ඒකාධිකාරයක් ගොඩනගා ගෙන තිබීම.

(i) AB (ii) AD (iii) BC (iv) CD

24) උඩරට ජෝතිය සිටුගේ කැරැල්ල මර්ධනය කර එහි බලයට පත් වූ පාලකයා වූයේ,

(i) VI බුවනෙකබාහු රජුය

(ii) අම්බුලුගල රජුය

(iii) සේනාසම්මත වික්‍රමබාහු රජුය

(iv) කරලියැද්ද රජුය

25) ක්‍රි.ව. 1818 ඌව වෙල්ලස්ස සටනේදී සටන්කරුවන් අතින් මරුමුවට පත් වූ පුද්ගලයෙකි.

(i) විල්බාවේ දොරේ සාමි

(ii) හජ්ජිමරික්කාර්

(iii) මොල්ලිගොඩ

(iv) දුනුවිල බණ්ඩා

26) මෙම ප්‍රකාශ අතුරෙන් ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකරුගේ කාලයට අදාළ ප්‍රකාශ තෝරන්න.

A - මුත්තුසාමි උඩරට රජු ලෙස ප්‍රකාශයට පත් වීම

B - ජෝන් ඩොයිලිගේ සහයෙන් උඩරට අරාජික කිරීම

C - ඇහැලේපොළගේ ආරාධනාව පරිදි උඩරට ආක්‍රමණය සිදු කිරීම.

D - ක්‍රි.ව. 1803 දී මැක්ඩොවෙල් යටතේ උඩරට ආක්‍රමණය කිරීම

(i) CD (ii) AC (iii) AD (iv) BC

27) මෙරට වතු වගාවේ දියුණුවට විශාල බලපෑමක් ඇති කරන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් ද?

(i) ඩොනමෝර් ප්‍රතිසංස්කරණය (ii) මැනිං ප්‍රතිසංස්කරණය

(iii) කෝල්බෲක් ප්‍රතිසංස්කරණය (iv) මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය

28) 7 වන භුවනෙකබාහු රජු කෝට්ටේ පාලකයා බවට පත් වූයේ,

(i) පෘතුගීසි සහයෙන් ය. (ii) විජයබා කොල්ලයෙන්ය.

(iii) මුල්ලේරියා සටනින් ය. (iv) රයිගම් බණ්ඩාර මිය යෑමෙන් ය.

29) "මුල්ලේරියා වෙලේ වතුර ලෙයට හැරවුණා" යන සිදුවීම හා සම්බන්ධ කුමරු හැඳින් වූ නාමය වනුයේ,

(i) වීකිරිකුමරුය. (ii) මහා අස්ථාන කුමරුය.

(iii) කන්නසාමි කුමරුය. (iv) මුත්තුසාමි කුමරුය.

30) ක්‍රි.ව. 1848 දෙවැනි නිදහස් සටනේ වැදගත් ප්‍රතිඵලයක් ලෙස ගතහැකි වගන්තිය කුමක් ද?

(i) බදු අහෝසි කිරීම

(ii) අත්අඩංගුවට පත් නායකයින් නිදහස් කිරීම

(iii) දේශීය කෘෂිකර්මාන්තයේ දියුණුවට රජය ක්‍රියා මාර්ග ගැනීම

(iv) අනිවාර්ය සේවා රාජකාරි අහෝසි කිරීම

31) බ්‍රිතාන්‍යයන් විසින් වැවීම ආරම්භ කරන ලද වතුබෝග අතර අසාර්ථක වූ බෝග වර්ගය ඇතුළත් වරණය වූයේ,

(i) සිංකෝනා (ii) කෝපි (iii) තේ (iv) රබර්

32) යුරෝපයේ දේශගවේෂණ කටයුතු සඳහා මුලින්ම අනුග්‍රහය දැක් වූ රටවල් යුගලය අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

(i) පෘතුගාලය - බ්‍රිතාන්‍ය (ii) ප්‍රංශය - ස්පාඤ්ඤය

(iii) පෘතුගාලය - ස්පාඤ්ඤය (iv) ප්‍රංශය - බ්‍රිතාන්‍ය

33) A සිට D දක්වා ඇති තනතුරු අතුරෙන් 1947 හා 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවලදී අහෝසි වූ තනතුරු නාම පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

A - ආණ්ඩුකාර තනතුර

B - අග්‍රාණ්ඩුකාර තනතුර

C - නාමික විධායක ජනාධිපති තනතුර

D - විධායක ජනාධිපති තනතුර

(i) A හා C ය. (ii) A හා B ය. (iii) B හා C ය. (iv) B හා D ය.

34) ක්‍රි.ව. 1972 ව්‍යවස්ථාවට අනුව සිවිල් නඩු විසඳීම සඳහා පිහිටවනු ලැබූ උසාවි වර්ගය වූයේ,

(i) මහේස්ත්‍රාත් අධිකරණය (ii) අභියාචනාධිකරණය

(iii) දිසා අධිකරණය (iv) මහාධිකරණය

35) විධායක ජනාධිපතිවරයා සතු වරප්‍රසාදයක් ලෙස සැලකෙනුයේ,

(i) අගවිනිසුරු පත් කිරීම

(ii) පාර්ලිමේන්තුව කැඳවීම සහ විසුරුවා හැරීම

(iii) ඕනෑම අවස්ථාවකදී අධිකරණයක නඩු පැවරිය නොහැකි බව

(iv) විදේශ රටවල සංචාරය කිරීමට ඇති හැකියාව

36) පහත දැක්වෙන කාර්මීකරණයේ ප්‍රතිඵල අතුරෙන් සමාජ ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දැක්වෙන පිළිතුර කුමක් ද?

(i) මුඩුක්කු නිවාස බිහිවීම

(ii) අඩු මිලට භාණ්ඩ ලබා ගත හැකිවීම

(iii) බැංකු බිහිවීම

(iv) ගනුදෙනු පහසු වීම

37) මධ්‍යතන යුගයේ යුරෝපයේ ක්‍රිස්තියානි පල්ලියේ බලයට එරෙහිව නැගී සිටි දේව ධර්මයේ මහාචාර්යවරුන් ඇතුළත් පිළිතුර කුමක් ද?

(i) මාටින් ලූතර් - බොකෑෂියෝ

(ii) ජෝන් වයික්ලිෆ් - අලිගියර්ඩාන්ටේ

(iii) ජෝන් හස් - ඉරාස්මස්

(iv) පෙට්රාක් - ප්‍රැන්සිස් බේකන්

- පහත A, B, C, D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා අංක 38, 38 හා 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - උඩරට පහතරට ඒකාබද්ධ කිරීම
කොල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය

B - මැනිං ප්‍රතිසංස්කරණය
ව්‍යවස්ථාදායක සභාව හඳුන්වාදීම

C - නාමික විධායක අග්‍රාණ්ඩුකාර ධුරය
1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව

D - 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
සමානුපාතික නියෝජන ක්‍රමය

38) පළමුවැන්න මගින් දෙවැන්න හඳුන්වා දුන් බව දැක්වෙන යුගලය කුමක් ද?

(i) A (ii) B (iii) C (iv) D

39) පළමුවැන්න දෙවැන්නේ ප්‍රතිඵලයක් බවට දැක්විය හැකි යුගලය කුමක් ද?

(i) A (ii) B (iii) C (iv) D

40) දෙවැන්න ක්‍රියාත්මකවීමත් සමඟ පළමුවැන්න අහෝසි වූ බව දැක්වෙන පිළිතුරු යුගලය කුමක් ද?

(i) A (ii) B (iii) C (iv) D

(ලකුණු 1 × 40=40)